# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 ඔක්තෝබර් මස 27 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1994 ඔක්තෝබර් මස 28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

**කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.**

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 ඔක්තෝබර් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 50/94

අල්ලස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

26 වන අධිකාරයේ 2අ. 3, 4, 5. 7 හා 10 වන වගන්ති ඉවත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්ලස් පනතේ 2අ, 3, 4, 5, 7 හා 10 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 අ වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තියේ (4) වන උපවගන්තියෙහි යෙදෙන පිළිවෙළින් "අල්ලස් කොමසාරිස්වරයා" සහ "කොමසාරිස්වරයා" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ඉවත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28 අ වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පනත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 28අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"වරදක් සිදු කිරීම හා සම්බන්ධ දේපළ රාජසන්තක කිරීම.

28අ. (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, අධිකරණයක් විසින් මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක, අධිකරණය විසින් 26 වන වගන්තිය හෝ 26අ වගන්තිය යටතේ දණ්ඩනයක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට, අල්ලසින් හෝ අල්ලසින් ලැබුන මුදල්වලින් අත්කරගෙන ඇතැයි තීරණය කෙරෙන චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් සියලු බැඳීම්වලින් තොරව රාජ සන්තක කළ යුතු යයි ආඥා කළ හැකි ය:

එසේ වුව ද, රාජසන්තක කිරීමේ ආඥාවක් කළ යුතු දැයි තීරණය කිරීමේ දී, වටිනාකම සඳහා සද්භාවයෙන් මිළදී ගත් තැනැත්තකුගේ හෝ ඒ දේපළ විෂයයෙහි සද්භාවයෙන් සම්බන්ධතාවක් වටිනාකම සඳහා අත් කර ගෙන ඇති වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් කෙරෙහි ඒ ආඥාව හානිකර වීමට ඉඩ තිබේ ද යන වග සැලකිල්ලට ගැනීමට, අධිකරණයට හිමිකම ඇත්තේ ය.

2—ඕ032771—5,485 (94/09)

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක්—

(අ) රාජ සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, රාජ සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින්, හෝ අනුමත කරමින් ඒ අභියාචනය තීරණය කරනු ලැබූ විට ;

(ආ) රාජ සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, අධිකරණයේ ඒ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලය ඉකුත් වූ විට

බලාත්මක විය යුතු ය. ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 30 අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 30අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නීති විරෝධී තුටු පඩුරක් ලබාගන්නා තැනැත්තකු අල්ලාගනු ලැබූ විට කාර්ය පටිපාටිය.

30අ. (1) යම් නීති විරෝධී තුටු පඩුරක් භාර ගන්නා, අයදින හෝ පිරිනමන යම් තැනැත්තකු, කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු විසින් අල්ලා ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින්—

(අ) ඒ තැනැත්තා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව යම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන යා යුතු ය ; හෝ

(අ) ඒ තැනැත්තා නීති විරෝධී තුටු පඩුරක් භාර ගැනීමේ දී, අයැදීමේ දී හෝ පිරිනැමීමේදී අල්ලා ගනු ලැබූ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් සමග යම් මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඇ) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් තැනැත්තා විසින් නීති විරෝධී තුටු පඩුරක් ලෙස භාර ගන්නා ලදැයි, අය දින ලදැයි හෝ පිරිනමන ලදැයි කියනු ලබන මුදල් නෝට්ටු කිසිවක්, ඒ නෝට්ටු

එසේ භාර ගන්නා ලදැයි, අයදින ලදැයි හෝ පිළිගනු ලදැයි කියනු ලබන බවට, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ වාර්තාවක් ද සමග මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් තැනැත්තකු යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා නඩු විභාගය අවසන් වන තෙක් රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ය:

එසේ වුවද, මහෙස්ත්‍රාත්වරයා විසින් අති විශේෂ අවස්ථාගත කරුණු යටතේ හා වාර්තා ගත කළ යුතු කරුණු මත, ඒ තැනැත්තා නඩු විභාගය අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මුදල් නෝට්ටු කිසිවක් යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, සහතිකයේ දැක්වෙන වටිනාකමින් යුත් හා අංක දරන මුදල් නෝට්ටු තමා වෙත ඉදිරිපත් කරන ලද බවට තමාගේ අත්සන යටතේ වූ සහතිකයක් මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ නෝට්ටු භාර ගන්නා ලදැයි, අයදින ලදැයි හෝ පිළිගනු ලදැයි කියනු ලබන තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් නඩු කටයුත්තක දී, ඒ නෝට්ටු ඉදිරිපත් කිරීම වෙනුවට, ඒ සහතිකය ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ වූ යම් නඩු කටයුත්තක දී, අත්අඩංගුවේ සිටින තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරන බව, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දෙනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා නොපමාව ම නිදහස් කරනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය මෙයින් ඉවත් කරනු කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දූෂණය. 70. ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදු කිරීමේ හෝ තමා වෙත හෝ යම් තැනැත්තකු වෙත අයුතු සහගත ලෙස හෝ

නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්, හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදුවිය හැකි බව නැත හොත් යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක් වෙන යම් ක්‍රියාවක්, එනම්—

(අ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට තමාට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් කරන හෝ කිරීමෙන් වැළකී සිටින ;

(ආ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට, වෙනත් යම් රජයේ සේවකයකු පොළඹවන ;

(ඇ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර තමාට දැන ගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන ;

(ඈ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර යම් තීරණයක් ගැනීමෙහි ලා සහභාගි වන ;

(ඉ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධුරය තෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන

යම් රජයේ සේවකයකු, දූෂණය පිළිබඳ වරද සම් බන්ධයෙන් වරදකරු විය යුතු අතර, මහෙස් ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනා ගාරගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ "4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අල්ලස් කොමසාරිස්වරයා විසින් හෝ" යන වචන අත්හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධ නය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය ඉවත් කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ, (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "හෝ විමර්ශනයක් අතරතුර දී අල්ලස් කොමසාරිස්වරයා විසින් ප්‍රකාශය වාර්තාගත කර ඇත්තේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා" යන වචන අත් හැරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "හෝ එවැනි යම් තැනැත්තකු" යන වචන අත් හැරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "හෝ එවැනි යම් තැනැත්තකු" යන වචන අත් හැරීමෙන් ;

(4) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයේ "හෝ එවැනි යම් තැනැත්තකු" යන වචන අත් හැරීමෙන් ; සහ

(5) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "හෝ එවැනි යම් තැනැත්තකු" යන වචන අත් හැරීමෙන්.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තියේ "හෝ මේ පනත යටතේ පත් කරන ලද යම් නිලධරයකුට" යන වචන යෙදෙන කවර හෝ තැනක ඒ වචන අත් හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ "අල්ලස් කොමසාරිස්වරයාගේ හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධරයකුගේ" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "අල්ලස් කොමසාරිස්වරයා" යන වචන වෙනුවට "කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "නීතිපතිවරයා" යන වචනය වෙනුවට "කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය ඉවත් කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "අල්ලස්" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"කොමිෂන් සභාව" යන්නෙන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමට 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

(2) "රජයේ සේවකයා" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "රජයේ සේවකයා" යන්නට අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයකු, කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයකු, පළාත්සභා ආණ්ඩුකාරවරයකු, පළාත්සභා අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, රජයේ සෑම නිලධරයකු, සේවකයකු හෝ සේවා නියුක්තයකු හෝ පාරිශ්‍රමිකයක් ලැබුව ද නොලැබුව ද පළාත් සභාවක, පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනක හෝ කොටස් වලින් සියයට පණහකට වැඩි ප්‍රමාණයක් ආණ්ඩුව විසින් දරනු ලබන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක යම් සභාපතිවරයකු, අධ්‍යක්ෂවරයකු, අධිපතිවරයකු, සමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු, පළාත්සභා රාජ්‍ය සේවයේ සාමාජිකයකු, සෑම ජූරි සභිකයකු, සෑම බලයලත් මිනින්දෝරුවරයකු සහ යම් අධිකරණයක් විසින් හෝ වෙනත් යම් රජයේ නිසි බලධරයකු විසින් යම් කටයුත්තක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වාර්තා කිරීම පිණිස යොමු කර ඇති සෑම බේරුම්කරුවකු හෝ වෙනත් තැනැත්තකු ද ඇතුළත් වේ :

එසේ වුව ද, යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හැර ඇති හා ඒ ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම යම් තැනැත්තකු වෙත පැවරී ඇති අවස්ථාවක, ඒ ආයතනය විසුරුවා හැරීමට ඉහතින් ම සේවයෙහි නියුක්තව සිටියා වූ සහ එය විසුරුවා හැරීමෙන් පසුව තවදුරටත් සේවයෙහි නියුක්තව සිටින්නා වූ ඒ පළාත් පාලන ආයතනයේ සෑම සේවා නියුක්තයකු ම මේ පනතේ කාර්ය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අතීතයට බලපෑම.

**18.** (1) මේ පනතේ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එහි විස්තර කර ඇති දඬුවම, නියමිත දිනයට පෙර සිදු කරන ලද වරදක් සඳහා නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ 16(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය—

(අ) එය, පළාතක ආණ්ඩුකාරවරයකුට, පළාතක අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයකුට, හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකුට, නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ පළාතක රාජ්‍ය සේවයේ සාමාජිකයකුට අදාළ වන තාක් දුරට, 1987 නොවැම්බර් මස 14 වන දින බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ආ) එය, වෙනත් යම් තැනැත්තකුට අදාළ වන තාක් දුරට, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 යි. විදේශීය රු. 1,160 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව ප්‍රකාශිත එක් එක් පිටපත තැපෑලෙන් ලබාගත හැකිය.